මුදල් මාරු කිරීම හා පුහුණු ව්‍යාපෘති මඟින් ආබාධ සහිත පුද්ගලයන්ට ආධාර ලබාදීමේ ව්‍යාපෘතිය (දිරිසවිය) - 2014

---

මුදල් මාරු කිරීම හා පුහුණු ව්‍යාපෘති මඟින් ආබාධ සහිත පුද්ගලයන්ට ආධාර ලබාදීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) අතර 2012 නොවැම්බර් 30 දින එළඹි අංක ටීඑෆ් 013135 - එල්කේ දරන ප්‍රදාන ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.06 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, එවකට සමාජ සේවා අමාත්‍යාංශය වර්තමානයේ සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ආබාධිත පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ පරිශ්‍රමයේ කොටසක් වශයෙන් උතුරු පළාත, උතුරු මැද හා වයඹ පළාතේ දිස්ත්‍රික් නවයක ආබාධිත පුද්ගලයන් සඳහා ඉලක්කගත මුදල් මාරු කිරීම හා පුහුණුව ලබාදීම ව්‍යාපෘතියේ අරමුණ වේ. පීඩාවට පත් ආබාධිත පුද්ගලයන් සඳහා මුදල් දීමනා ලබාදීම සහ වෘත්තිය පුහුණු හා කුසලතා සංවර්ධන නියමු වැඩසටහන ක්‍රියාත්මක කිරීම නම්වූ සංරචක දෙකකින් ව්‍යාපෘතිය සමන්විත වේ. ප්‍රදාන ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 336.7 කට සමාන එජඩො මිලියන 2.59 ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යායනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 නොවැම්බර් 30 දින ආරම්භ කරන ලද අතර 2015 මාර්තු 31 වනවිට නිම කිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත්

පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලටට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වර්ධනය කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ප්‍රදාන සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල් වලින් ව්‍යාපෘතිය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානයෙන් මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

2. මූල්‍ය ප්‍රකාශන
-------------------

2.1 මතය
--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය
---------------------------------------

3.1 අරමුදල් උපයෝජනය
--------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය තුළ අයවැය ගත වෙන්කිරීම් හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරනලද වෙන්කිරීම | | උපයෝජනය කළ අරමුදල් - සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් - 2014 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන | 2.59 | 336.70 | 1.18 | 155 | 1.15 | 150.9 | 1.74 | 228 |
| | 2.59 | 336.70 | 1.18 | 155 | 1.15 | 150.9 | 1.74 | 228 |

රු.මිලියන 336.7 කට සමාන එජඩො මිලියන 2.59 ක්වූ මුළු ප්‍රදාන වෙන්කිරීම්වලින් රු.මිලියන 228 කට සමාන එජඩො මිලියන 1.74 ක් එනම් සියයට 67 ක් 2014 නොවැම්බර් 31 වන විට උපයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය. එබැවින් රු.මිලියන 113.7 කට සමාන එජඩො මිලියන 0.85 ක ප්‍රදාන ව්‍යාපෘතියේ ඉතිරි මාස 03 ක කාල පරිච්ඡේදය තුළ ඵලදායීව උපයෝජනය කළ හැකිවේද යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

3.2 භෞතික ප්‍රගතිය
--------------------

පීඩාවට පත් ආබාධිත පුද්ගලයන් සඳහා මුදල් දීමනා ලබාදීම සහ වෘත්තිය පුහුණු හා කුසලතා සංවර්ධන නියමු වැඩසටහන ක්‍රියාත්මක කිරීම යන ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් දෙක යටතේ සිදුකරන ලද කාර්යයන් පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, උතුරු පළාතේ, උතුරු මැද පළාතේ හා වයඹ පළාතේ දිස්ත්‍රික්ක 9 ක ආබාධිත පුද්ගලයින් 4,505 ක් සඳහා මූල්‍ය ආධාර සැපයීමට අපේක්ෂා කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රතිලාභීන් 4,434 ක් සඳහා පමණක් මූල්‍ය ආධාර සපයා තිබුණි.

(ආ) වැරදි ගිණුම් අංකයන් හා බැංකු සංකේත අංකයන් ආදී කරුණු හේතුවෙන් ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම්වලට මුදල් බැර කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී මුදල් ආධාර සඳහා වෙන්කරන ලද රු.2,901,000 ක මුදලක් රේඛීය අමාත්‍යාංශයට ආපසු යවා ඇති බව නිරීක්ෂණය විය. තවද ප්‍රතිලාභීන් 05 දෙනෙකුට කරන ලද එකතුව රු.81,000 ක මුදල් ආධාර සමාලෝචිත වර්ෂය තුළ බැංකු විසින් අඛණ්ඩව ආපසු යවා ඇති බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. කෙසේවුවද එම ප්‍රතික්ෂේප කිරීම් සඳහා හේතු විමර්ශනය කර විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ඇ) ප්‍රදාන ගිවිසුම අනුව, ආබාධිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු කාර්යයන් 2013 ජනවාරි මාසයේදී ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද එම පුහුණු කාර්යයන් 2014 ජුනි මාසයේදී ආරම්භ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පුහුණු කටයුතු සඳහා මුළු වෙන්කිරීම වූ රු.228,193,680 න් සියයට 04ක් නියෝජනය වන රු.10,819,680 ක මුදලක් පමණක් 2014 දෙසැම්බර් 31 දිනට වැය කර තිබුණි. තවද පුහුණුවන්නන් 300 ක් සඳහා පාඨමාලා ඉලක්ක කර තිබුණද පුහුණුවන්නන් 262 ක් සඳහා පාඨමාලා 18 ක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා තිබුණි.

(ඈ) පුහුණු ආයතන සමඟ එළඹි ගිවිසුම් අනුව, පවත්වන ලද පුහුණු පාඨමාලා පිළිබඳ ප්‍රගතිය හා ඒ පිළිබඳ දරන ලද වියදම් පිළිබඳ වාර්තා ඊළඟ මාසයේ දින 20 ක් ඇතුළත ව්‍යාපෘතියට ඉදිරිපත් කළ යුතුය.කෙසේ වුවද පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා රු.4,157,384 ක් වූ අත්තිකාරම් ලබා දී තිබුණද, පුහුණු ආයතන 06 ක් විසින් එම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.